7 වන පරිච්ඡේදය

# ලෝකයේ තෝරා ගත් නිෂ්පාදන කර්මාන්ත කීපයක ගති ලක්ෂණ

- ❖ කර්මාන්තයක් යනුවෙන් හැඳින්වෙන්නේ කිසියම් නිපැයුමක් වෙළෙඳපොළක් කරා ඉදිරිපත් කරනු ලබන ආර්ථික ක්‍රියාවලිය යි.
- ❖ සම්පත් උපයෝග කර ගෙන මිනිස් අවශ්‍යතා සපුරා ගැනීම පිණිස මිනිසාගේ ම මැදිහත් වීමෙන් කෙරෙන ආර්ථික ක්‍රියාවලියක් කර්මාන්තයක් යනුවෙන් හැඳින්වේ.
- ❖ මානව ශිෂ්ටාචාරයේ ඈත යුගවල දී පවා මිනිසා තම අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා උපකරණ නිපදවා ගැනීමට කටයුතු කළේ ය.
- ❖ 18 සියවසේ අග භාගයේ බ්‍රිතාන්‍යයේ ඇති වූ කාර්මික විප්ලවයත් සමග ස්වාභාවික සම්පත් යොදා ගෙන භාණ්ඩ නිෂ්පාදනය කිරීම මහා පරිමාණ ලෙස ලෝකය පුරා ව්‍යාප්ත විය.


කර්මාන්ත ස්ථානගත වීමට බලපාන සාධක

- ❒ අමුද්‍රව්‍ය - යපස්, ගල්අඟුරු, ජලය වැනි අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමේ පහසුව.
- ❒ බලය - අඩු වියදමින් බලය ලබා ගත හැකි වීම. (ගල්අඟුරු, ඛනිජතෙල්, ජල විදුලිය, තාප විදුලිබලය ආදි)
- ❒ ශ්‍රමය - ලාභ ශ්‍රමය හා පුහුණු ශ්‍රමය
- ❒ වෙළෙඳපොළ - ඇතැම් භාණ්ඩ සඳහා වෙළෙඳපොළ, ආසන්නයේ ම තිබීම.
- ❒ පරිවහනය - අඩු වියදමින් කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් තිබීම.
- ❒ ප්‍රාග්ධනය - පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ආයෝජනයන්
- ❒ භූමිය - විශාල භූමි ප්‍රදේශ
- ❒ රාජ්‍ය ප්‍රතිපත්ති - දේශීය හා විදේශීය කර්මාන්තකරුවන් දිරිගැන්වීම, කර්මාන්ත පිහිටුවන ස්ථාන තීරණය කිරීම, ශ්‍රමය සහ ප්‍රාග්ධන සුක්ෂම බව පිළිබඳ තීරණ ආදිය.
- ❒ යටිතල පහසුකම් - ජලය, විදුලිය, ප්‍රවාහනය, රක්ෂණය, සන්නිවේදනය වැනි පහසුකම්

කර්මාන්ත ස්ථානගත වීම සම්බන්ධයෙන් මෙම සාධක පොදුවේ බලපෑම් ඇති කළ අතර වර්තමානයේ කර්මාන්ත ස්ථානගත වීමේ දී එම සාධකවල යම් යම් වෙනස්කම් දක්නට ලැබේ. ඊට උදාහරණ කීපයක් පහත දැක්වේ.

- ❒ අමුද්‍රව්‍ය හා බලශක්තිය ආශ්‍රිත ව කර්මාන්ත ඇරඹීමට තිබූ නැඹුරුව අඩු වීම.
  උදා:- බලශක්තිය ලෙස ගල්අඟුරු යොදා ගැනීමේ දී ගල්අඟුරු ආකර අසල කර්මාන්ත ස්ථානගත කිරීම අවශ්‍ය වුව ද විදුලිබලය භාවිතය නිසා ඈත ප්‍රදේශවලට ද පහසුවෙන් විදුලිය ගෙන යා හැකි වී ඇත.
- ❒ නව තාක්ෂණික ක්‍රම හා ශිල්ප ක්‍රමවල වැදගත්කම.
- ❒ අතීතයේ ප්‍රාග්ධනය පුද්ගලයෙකු යෙදූ අතර වර්තමානයේ වැඩි වශයෙන් බහුජාතික සමාගම් ප්‍රාග්ධනය යෙදීම.

මේ අනුව ඉදිරියේ දී කර්මාන්ත ස්ථානගත වීමේ සාධක තව දුරටත් වෙනස් වීමට ඉඩ ඇත.




7.1 රූපය
තෝරා ගත් කර්මාන්ත කීපයක
ස්ථානගත වීමට බලපාන සාධක

### කපුපිළි කර්මාන්තය

කාර්මික විප්ලවයේ ආරම්භයත් සමග බ්‍රිතාන්‍යයේ කපුපිළි කර්මාන්තය ඇති විය. මැන්චෙස්ටර් නගරය මේ සඳහා ලෝක ප්‍රසිද්ධියක් ඉසිලූ අතර වර්ෂ 1913දී කපු රෙදි පිළිබඳ ඒකාධිකාරයක් හිමි කර ගන්නා ලදී. නමුත් අද ඒ තත්ත්වය බිඳ වැටී ඉන්දියාව, ජපානය, චීනය වැනි රටවල් කපු රෙදි නිෂ්පාදනය අතර ප්‍රමුඛත්වය හිමි කර ගෙන ඇත. (7.1 සිතියම)

කපුපිළි කර්මාන්තය ව්‍යාප්ත වූ රටවල්

- චීනය
- ඉන්දියාව
- ඇ. එ. ජනපදය
- එක්සත් රාජධානිය
- රුසියාව
- ඊජිප්තුව
- පාකිස්ථානය
- ජපානය
- ඉතාලිය
- බෙල්ජියම
- ප්‍රංශය

කපු කර්මාන්තය ප්‍රචලිත වීමට බලපෑ සාධක


- ❑ ඉන්දියාව, චීනය වැනි රටවලට කපු නිෂ්පාදනය කළ හැකි වීම.
- ❑ ජපානයට අමු කපු වෙනත් රටවලින් ආනයනය කිරීමට හැකි වීම.
- ❑ නවීන යන්ත්‍ර උපකරණ හා තාක්ෂණය භාවිත කිරීමට හැකි වීම.
- ❑ ලාභ ශ්‍රමය ❑ බල ශක්තිය ❑ වෙළෙඳපොළ ❑ ප්‍රවාහන පහසුකම්

- ඉන්දියාව
  - කපු පිළි නිෂ්පාදනය සඳහා වසර 2000කට වඩා පැරණි ඉතිහාසයක් ඇත.
  - ලෝකයේ ප්‍රමුඛතම කපු පිළි නිෂ්පාදකයා වේ.
  - රාජ්කොට්, අහමදබාද්, බැරෝඩා, මුම්බායි, පූනා, අග්‍රා, කල්කටා වැනි ප්‍රදේශ කපු වගාව මෙන් ම කපු පිළි කර්මාන්තය සඳහා ද ප්‍රසිද්ධියක් උසුලයි.
  - කර්මාන්තය දියුණු කිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබේ.

- ඇමරිකා එක්සත් ජනපදය
  - බ්‍රිතාන්‍යයින් ඇමරිකාවේ ජනපද පිහිටුවීමෙන් පසු කපු වගාව ආරම්භ විය.
  - අමුද්‍රව්‍ය, ශ්‍රමය, ජල විදුලිබලය පහසුවෙන් ලබා ගත හැකි වීම හා තාක්ෂණික දියුණුව මත කපු පිළි නිෂ්පාදනය ඉතා දියුණු මට්ටමක පවතී.

- ප්‍රවණතා
  - ආරම්භයේ දී ලාභ ශ්‍රමය වෙළෙඳපොළ යන සාධක මුලික කර ගෙන ස්ථානගත වූ කපු පිළි කර්මාන්තය වර්තමානයේ දී කපු වගා කරන රටවල ම බොහෝ දුරට ස්ථානගත වීම.
  - මුලදී කපු කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ වූ රටවල් වෙනුවට වර්තමානයේ වෙනත් රටවල් මුල් තැන ගැනීම.
    උදා:- බ්‍රිතාන්‍යය වෙනුවට චීනය, ඉන්දියාව හා ජපානය වැනි රටවල් ප්‍රසිද්ධ වීම.
  - ගෝලිය උණුසුම වැඩි වීමත් සමග ම කෘත්‍රිම රෙදි භාවිතය අපහසු වීම හා ශරීරයට අහිතකර වීම මත කපු රෙදි පිළිවලට ඇති ඉල්ලුම වැඩි වෙමින් පවතී.
  - තාක්ෂණික දියුණුව සමග නිෂ්පාදනවල ගුණාත්මක බව වැඩි වීම.
  - කපු මිශ්‍ර රෙදි නිපදවීම. ටෙට්රන් කෙඳි හා කපු කෙඳි මිශ්‍ර ව නිපදවීම.
  - නිෂ්පාදන ක්‍රියාවලිය විශාල වශයෙන් යාන්ත්‍රික වීම.

- ගැටලු
  - ප්‍රාග්ධන හිගය.
  - කෘත්‍රිම කෙඳිවලින් එල්ල වන තරගය. ටෙට්රන්, රේයෝන්, නයිලෝන් වැනි කෘත්‍රිම කෙඳිවලින් රෙදි නිපදවීම නිසා ඒවාට ඉල්ලුම වැඩි වීම.
  - තරගකාරී වෙළෙඳපොළ.
  - නිපුණ ශ්‍රමිකයින් හිග වීම.
  - ජන සංඛ්‍යාව වර්ධනය වීමත් සමග කපු වගා කිරීම සඳහා යොදා ගත හැකි ඉඩම් ප්‍රමාණය අඩු වීම.




**7.1 සිතියම**
**ලෝකයේ කපු වගා කරන ප්‍රදේශ**